# නමෝ බුද්ධාය!

2025 ජනවාරි
6 වන කලාපය

# මහමෙව්නාව සිංහල භාෂා පාසල පුවත් පත්‍රිකාව

මහමෙව්නාව සිංහල භාෂා පාසල මෙල්බර්න් පුරවරයේ උපන් ශ්‍රී ලාංකික දරුවන්ට ඔවුන්ගේ සිංහල භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහාත්, දරුවන් ගුණදහමින් පෝෂණය කිරීම සඳහාත් මහඟු පිටුවහලක් වන අතර ගරු අනුශාසක පින්වත් ස්වාමින්වහන්සේ ඇතුළු කාර්ය මණ්ඩලය ඇපකැප වී සිටී. වසර 2000කට වඩා පැරණි සිංහල භාෂාව ඉගෙනීමෙන් බොහෝ ප්‍රයෝජන අත්වේ. මහ රහතන් වහන්සේලා පවා භාවිත කරන මේ බස ධර්මාවබෝධය සඳහා අතිශයින් උපකාරී වේ. සෑම ඉරිදා දිනකම සිංහල භාෂා පාසල උදෑසන 10:30 සිට ප.ව 1:00 දක්වා පැවැත්වෙන සිංහල භාෂා පාසලට ඔබේ දරුවා ඇතුළත් කළ හැකිය.

## පුවත් කලාපයේ ශීර්ෂ:

- ගරු අනුශාසක ස්වාමීන් වහන්සේගේ පණිවිඩය
- විදුහල්පතිනියගේ පණිවිඩය
- 2025 වසර ඉදිරි වැඩසටහන්
- මාසික ළමා සීල භාවනා වැඩසටහන
- රුක් රෝපණ ව්‍යාපෘතිය
- නිකිණි මස මාසික ළමා සීල භාවනා වැඩසටහන
- කඨින පුණ්‍ය මංගල්‍යයල මහා සාංඝික දානය 2024
- සිගිති දහම් මංපෙත 2024
- සිසුන් ඇතුළත් කර ගැනීම - 2025



MAHAMEVNAWA
SINHALA LANGUAGE SCHOOL

# ගරු අනුශාසක ස්වාමීන් වහන්සේගේ පණිවිඩය

පින්වන්ත  දෙමාපියනි,

සියළු දෙවි මිනිසුන්ට හිතසුව පිණිස, යහපත පිණිස දෙදහස් පන්සිය වසරකටත් පෙර සිට මනුලොව පවතින්නා වූ අති නිර්මල වූ සම්බුදු සසුන මේ මිනිස් ලොව පවතින්නේ සිංහලයන් නිසාමය.

එම සොදුරු සත්පුරුෂ කෘත්‍ය කලා වූල සිංහලයන් මනුලොව සිය අදහස් හුවමාරු කලා වූ භාෂාව වනාහී සිංහල භාෂාවය. වසර දෙදහසක කාලය තුළ සිංහලයන්ගේ මෙම භාෂාව අතිෂයින් ම දියුණු වූ ද බලවත් වූයේ ද අන් කිසිවක් නිසා නොව, එම භාෂාවෙන් වසර දෙදහසකටත් පෙර සිට අද දක්වාම අප භාග්‍යවතුන් වහන්සේ සරණ ගිය සව්වන් ලෙස භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා පිරිස විසින් සම්බුදු වදන් ලොවට කියා දුන්නේ ද, ඉගෙන ගත්තේ ද, මෙනෙහි කලේ ද, එම සොදුරු භාෂාවෙන් බැවිනි.

අපගේ අනුබුදු මිහිදු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළ පසු මුලින්ම පූර්ව සිංහල භාෂාවෙන් අප මුනිදුන්ගේ සොදුරු දහම ලක්වැසියන්ට කියා දුන් සේක. එදායින් පසු,පමණ කළ නොහැකි ගුණ ඇති අභිඥාලාභී මහ රහත් මුනිවරුන් පවා එම භාෂාවෙන් දහම් දෙසූ සේක. සිංහල භාෂාවෙන් දහම් දෙසන කල්හී මගපල ලැබූ ගිහි පැවිදි පිරිස ද මෙතෙකැයි කිව නොහැක.

කාලය කෙමෙන් ගතවන විට සිංහල භාෂාව වනාහී සසරින් නිදහස් වනු කැමැති සියළු මිනිසුන් හට සම්බුදු වදන්හි ඇති ගම්භීර අරුත් එලෙසින් ම දැනගත හැකි සොදුරුතම භාෂාව බවට පත්වී ඇත. එනිසා සිංහල භාෂාව ඉගැන්වීමට දරනා මෙම වෑයමේ සොදුරුතම ඵලය වනාහී සිංහල භාෂාවෙන් සම්බුදු වදන් ඉගෙනිමින් ධර්මයේ හැසිරීමට වාසනාව ලැබීමයි.

# විදුහල්පතිනියගේ පණිවිඩය

නමෝ බුද්ධාය !

පින්වත් දෙමාපියනි,

බුදු දහමින් සුපෝෂිත වූල සිංහල සංස්කෘතියට අනුව හැදුනු වැඩුනු දරුවන් මුළු මහත් සමාජයටම වටිනා සම්පතකි.

සත්පුරුෂ ඇසුරේ රැදෙමින් ගුණ ධර්ම පුරුදු කර ගැනීම පිණිස සිංහල භාෂා පාසල මගින් දරුවන්ට ලැබෙන පිටුවහල ඉමහත්ය.

සිංහල භාෂා පාසල තුල, දෙවැනි භාෂාව ලෙස සිංහල ඉගෙන ගනිමින්, ගුණ ධර්ම වඩා ගනිමින් දරුවන් ගත කරන කාලය කිසිසේත් අපතේ නො-යන්නකි.

නිවසේදීද  දෙමාපියන් විසින් දරුවන්ට සිංහල භාෂාව ඉගෙන ගැනීම පිණිස  හැකි සෑම ආකාරයකින්ම උපකාර කල යුතුය.

කුඩා අවදියේ සිටම බුදු දහම හා සිංහල භාෂාව ඉගෙනීම තුලින් දරුවන්ගේ ජීවිතයට ලැබෙන පන්නරය හා පෞරුෂය දරුවන් තරුණ වියට පැමිණි පසු ලබා දීම දුෂ්කර කාර්යයකි.

ගුණ දහමින් සුපෝෂිත, සිංහල සංස්කෘතියට අනුව හැදෙන දරුවා, දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ අවවාද වලට අනුව තම ජීවිත යහපත් ආකාරයෙන් ගොඩ නගා ගනිමින් සාමකාමී, ගුණ ගරුක පුරවැසියන් ලෙස අනාගතයේදී මුළු සමාජයම ආලෝකමත් කරනු ඇත.


නුවණැති ඔබත්, දරුවන්හට සත්පුරුෂ ඇසුර ලබා දී ගුණවත්, සිල්වත්, සුන්දර දරුවන් සමාජයට දායාද කිරීමට අධිෂ්ඨාන කර ගන්න.

තෙරුවන් සරණයි !

# සිංහල භාෂා පාසලේ 2025 වසරේ ඉදිරි වැඩසටහන්

2025

- සෑම මසකම මාසයේ පළමු ඉරිදා ළමා සිල් වැඩසටහන
- වෙසක් සදහම් මංගල්‍යය 2569
- පොසොන් පොහොය වැඩසටහන
- ළමා සාංඝික දානය
- කඨින පිංකම
- රුක් රෝපණ ව්‍යාපෘතිය
- සිගිති දහම් මංපෙත
- ළමා නේවාසික භාවනා වැඩ සටහන



## විශේෂ දැනුම් දීම

ඔබේ දරුවාට ආහාර අසාත්මිකතාවක් (Food Allergy) හෝ වෙනත් රෝගී තත්වයක් තිබේ නම් පාසල් කාර්ය මණ්ඩලය දැනුවත් කළ යුතු වෙයි. දෙමාපියන් කරුණාකර අදාළ පෝරමය පුරවා ළමා ආරක්ෂක නිලධාරීන්ට බාර දෙන්න.

# මාසික ළමා සීල භාවනා වැඩසටහන

( මහමෙව්නාව මෙල්බර්න් අසපුවේ පින්වත් ස්වාමීන් වහන්සේලා විසින් මෙහෙයවනු ලබන ළමා සීල භාවනා වැඩසටහන (අවුරුදු 5 - 17 දක්වා ළමුන් සඳහා)සෑම මසකම පළමු සතියේ ඉරිදා දින උදෑසන 8:00 සිට සවස 4:00 දක්වා , මෙල්බර්න් මහමෙව්නාව භාවනා අසපුවේ දී පැවැත්වේ. සහභාගී වන ළමුන්ගේ දෙමාපියන් සඳහා ද මෙදිනම ධර්ම ශාලාවේ සීල භාවනා වැඩ සටහනක් අසපුවේ දී පැවැත්වේ.)




## නිකිණි මස මාසික ළමා සීල භාවනා වැඩසටහන

නිකිණි පුරාණ පසළොස්වක පොහොය දිනය ආගමික වශයෙන් වැදගත් වන උතුම් පොහොය දිනයක් ලෙස සැලකේ. වස් කාලය ආරම්භය, ආනන්ද මහරහතන් වහන්සේ රහත් වීමල ආනන්ද හිමියන් රහත් වීමෙන් පසු පවත්වන ලද ප්‍රථම ධර්ම සංගායනාව, ඇතුළු බොහෝ අංගවලින් යුතු මෙම නිකිණි පුර පසළොස්වක් පොහෝ දවස ඉතා වැදගත් පොහෝ දවසක් සෙ සලකනු ලැබේ. මහමෙව්නාව භාවනා අසපුවෙහි සිංහල භාෂා පාසලෙහි දරුවන් නිකිණි මස ළමා සීල භාවනා වැඩසටහනට සහභාගී වීම මේ ඔබට දිස්වන්නේ එහි සොඳුරු දසුන් පෙළකි.












# රුක් රෝපණ ව්‍යාපෘතිය

මහමෙව්නාව භාවනා අසපුව විසින් සංවිධානය කරන ලද රුක් රෝපණ උත්සවය 2024 ජූලි 14 වන දින සෙවිල් විනෝද රක්ෂිතයේ පැවැත්විණි. රුක් රෝපණ ව්‍යාපෘතිය සඳහා සිංහල භාෂා පාසල සහ දහම් පාසලෙහි දරුවන්ට ද සහභාගී වීමට අවස්ථාව ලැබිණි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සොබාදහමට ගරු කිරීම, රුක් රෝපණය සහ සංරක්ෂණය අගය කළ සේක. පෘථිවියේ භාරකරුවන් වීමට දරුවන් සවිබල ගැන්වීම ඉතා වැදගත් වේ. මෙම වගකීම පිළිබඳ හැඟීම ඇති කිරීම සඳහා බලපාන එක් මාර්ගයක් වන්නේ දරුවන් සහ ඔවුන්ගේ දෙමව්පියන් විසින් මෙහෙයවනු ලබන රුක් රෝපණ මුලපිරීම් මගිනි රුක් රෝපණ ක්‍රියාකාරකම් සඳහා ළමුන් සම්බන්ධ කර එය වාර්ෂික උත්සවයක් බවට පත් කිරීමෙන්, සහයෝගීතාව සහ ප්‍රජා සහභාගීත්වය සඳහා දරුවන්ට එය අවස්ථාවක් ද ලබා දේ. මේ දැක්වෙන්නේ එහි සොඳුරු දසුන් කිහිපයකි. ඔබ සියලු දෙනාටද මේ පින් අනුමෝදන් වෙත්වා...





# කඨින පුණ්‍ය මංගල්‍යය සහ

# මහා සාංඝික දානය

උතුම් චීවර මාසයේ දී දුර්ලභ වූ කඨින චීවර මංගල්‍යය සමග සම්බන්ධ වී මෙල්බර්න් නුවර මහමෙව්නාව සිංහල භාෂා පාසලෙහි හා දහම් පාසලෙහි දරුවන්ට ඉහළම කුසල් රැස් කිරීමට හැකි විය. මහා සාංඝික දානය එදිනම 2024 නොවැම්බර් මස 09 දින සැමරුම් උත්සවය පවත්වන්නට යෙදුණි. මනාකොට සකස්කරන ලද මේ මහා සාංඝික පිණ්ඩපාතය දානමය පින්කමෙහි දී දරුවන්ගේ ආධ්‍යාත්මික ගුණ ගරුකභාවය සහ මැනවින් පින් රැස්වන අයුරින් සංවිධානය කර තිබීම දකින්නට ලැබුණ විශේෂ ලක්ෂණයකි. මේ පිංකම සිදු කළා වූ සිගිති දූ දරුවන්, දෙමාපියන්,ගුරුවරුන් ඇතුළු සියලු දෙනාටත්, දැකබලා සතුටු වන සියලු දෙනාටත් මේ සියලු පුණ්‍ය ධර්මයන් උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීම පිණිසම උපකාර වෙත්වා...







# සිඟිති දහම් මංපෙත 2024

මෙල්බර්න් නුවර මහමෙව්නාව භාවනා අසපුවෙහි ඉරිදා දහම් පාසල සහ සිංහල භාෂා පාසලෙහි දරුවන්ගේ කුසලතා ඔප්නංවමින් සිඟිති දහම් මංපෙත 2024 සැප්තැම්බර් 14 සෙනසුරාදා වන දින දර්ශනීය අන්දමින් පවත්වන්නට යෙදුණි. දරුවන් වසරක් පුරා ඉගෙන ගත් ඔවුන්ගේ දහම් අධ්‍යාපනික කටයුතු වල සහ ගුණ දහම් හි සුපෝෂිත බව දරුවන්ගේ කුසලතා තුළින් මනාව පිළිබිඹු විය. මෙල්බර්න් මහමෙව්නාව දහම් පාසල් සිසුන්ගේ සහ සිංහල භාෂා පාසල් සිසුන්ගේ විස්මිත දක්ෂතා එළිදැක්වූ 2024 වාර්ෂික කලා උළෙල You Tube ඔස්සේ නැරඹිය හැක.

https://youtu.be/eMz6KvLXTPo?si=Oj12Ilujp2PDjyx5









මෙල්බර්න් නුවර මහමෙව්නාව අසපු වාසී ගරු අනුශාසක පින්වත් ස්වාමින්වහන්සේ ඇතුළු කාර්ය මණ්ඩලය,සිංහල භාෂා පාසලෙහි සහ ඉංග්‍රීසි දහම් පාසලෙහි දරුවන් සහ දැක බලා සතුටු වන සියලු දෙනාටත් මේ පින් අනුමෝදන් වෙත්වා. සසර දුකින් අත්මිදෙන්නට මේ පින් උපකාර වෙත්වා...














# සිසුන් ලියාපදිංචි කර ගැනීම



## වැඩි විස්තර සඳහා අප අමතන්න

මෙල්බර්න් මහමෙව්නාව බෞද්ධ භාවනා අසපුව

71 MONBULK RD, MT EVELYN, VICTORIA 3796
SINHALASCHOOL@MAHAMEVNAWA.ORG.AU

දුරකථන: (+61) 3 9736 3937

**Facebook:** https://www.facebook.com/melbournebuddhistkids

**Homepage:** https://www.mahamevnawa.org.au/sunday-sinhala-language-school/

- දරුවන්ගේ ගුණාත්මක බවත් දහම් අධ්‍යාපනයත්, සිංහල භාෂාවත් ඔබේ දරුවාට ලබාදීමට ඔබත් බලාපොරොත්තු වන්නේ නම් සිසුන් පාසැලට බඳවා ගැනීමේ විස්තර සඳහා කරුණාකර මහමෙව්නාව භාෂා පාසැලේ වෙබ් අඩවියට පිවිසෙන්න.

- https://www.mahamevnawa.org.au/sls/enrolment/.

## මහමෙව්නාව සිංහල භාෂා පාසල